
# නිකී අපේ සුරතලා



රිසඳි රෙහන්සා දිසානායක

# නිකී අපේ සුරතලා

රිසඳි රෙහන්සා දිසානායක

නිකී අපේ සුරතලා

රිසඳි රෙහන්සා දිසානායක

2023 නොවැම්බර් 15 දින

# පිදුම

දස මසක් මා කුස හොවා,

මෙලොවට බිහි කර ,

ලේ කිරි කර දී මා හදා වඩා ගත්,

ආදරණීය අම්මාටත් ,

මාගේ නිබඳ ශක්තිය වන,

ආදරණීය අප්පච්චීටත්,

මාගේ මෙම මුල්ම කෘතිය

සෙනෙහසින්

පුද දෙමි..

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කර ගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසැල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්ව දෙන ලදී.දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍යය මාසයට සමගාමීව අප පාසැල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබෙන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය , ගුරුභවතුන්,දෙමාපියන්,ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් ගුරු මහතාගේ සේවය ද අගය කරමි.

ශෂිකලා සේනාධීර.
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.10.20

එකමත් එක කාලෙක අයියා කෙනෙක් සහ නංගි කෙනෙක් සිටියා. දවසක් දා මේ දෙන්නා අත්තම්මා සමඟ සෙල්ලම් කරන්නට වත්ත පහළට ගියා.අයියයි,නංගියි ටික වේලාවක් සෙල්ලම් කළා. ඔහොම සෙල්ලම් කරමින් සිටින විට වත්ත ඇතුළෙන් ශබ්දයක් ඇසුණා.

"නංගි මොකද්ද ඒ සද්දේ?, කොහෙන්ද ඒ සද්දේ ඇහෙන්නේ?" අයියා ඇසුවා.

"සතෙක් කෑ ගසනවා වගේ නේද අයියේ ඇහෙන්නේ?" නංගි කිව්වා.

"අනේ..... අපි ඒ සද්දේ තියෙන පැත්තට යමුද අත්තම්මේ?" අයියා අත්තම්මාගෙන් ඇසුවා.



"ඔව් පුතේ අපි අඩිය ඉක්මන් කරලා යමු.'' අත්තම්මා කිව්වා.


තුන්දෙනාම ශබ්දය ඇසෙන පැත්ත සොයාගෙන ඉක්මනින් ගියා.

"අනේ...මෙන්න බල්ලෙක් වළකට වැටිලා!....." නංගි කිව්වා.

"අනේ... පව් නේද නංගි ,අපි කොහොම හරි බල්ලාව වළෙන් ගොඩට ගනිමු." අයියා කිව්වා.

අත්තම්මා වටපිට බැලුවා.අර උස ගහේ එතිලා තියෙන වැල් පොටක් ගලවාගෙන එන්න පුතේ, අත්තම්මා කිව්වා.

අයියයි නංගියි වැල් පොට අදින්න පටන් ගත්තා.



“ආහ් ...... ආහ් ... හරිම තදයි නේද අයියේ..?”

“ඔව් නංගි  තව ටිකයි, අපි කොහොම  හරි අදිමු.”

අයියයි නංගියි එකතු වෙලා වැල් පොටක් කඩලා ගත්තා.අයියා වැල් පොට වළට දැම්මා.බල්ලා හීන් සැරේ වැල් පොට දිගේ උඩට නැගලා වලෙන් ගොඩට ආවා.හැමෝටම හරිම සතුටුයි.



"අත්තම්මේ.. අපි මේ බලු පැටියා ගෙදර අරන් යමුද?"

"හොඳයි  පුතේ,  අපි ගෙදර අරන් යමු."

බලු පැටියා ගෙදර අරන් ගියා.ඉන් පසු  අයියයි නංගියි එකතු වෙලා බල්ලාට කෑම  සහ වතුර දුන්නා.නහවා පිරිසුදු කලා.තුවාල වලට බෙහෙත් දැම්මා.

සිදු වූ දෙය අම්මාටත්,තාත්තාටත් විස්තර කළා.අම්මාත් , තාත්තාත් බලු පැටියා හදා ගැනීමට කැමති වුණා.




“අයියේ,අපි බලු පැටියාට නමක් දාමු ද?”

“හොඳයි නංගී”

“එහෙනම් අයියේ, අපි මෙයාට ‘නිකී’ කියලා කතා කරමු.”

නංගි යෝජනා කළා.අයියත් ඒ නමට කැමති වුණා.කාලයක් ගත වුණා.බලු පැටියා ගෙදර අයත් සමඟ ආදරයෙන් ජීවත් වුණා.



නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත්  සමඟ සිදු වන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍යය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරියන්ය.පාසැල තුළ ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම්,දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින්  හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල්  ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

ISBN 978-624-206-800-8